කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2016

කතෝලික ධර්මය

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම :-..............................................................................

විභාග අංකය :- ..........................................

ශ්‍රේණිය :- 11 ..............                                                       කාලය පැය :- 03

## 1 කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. පැරණි ගිවිසුමට අයත් එළිදරව් සාහිත්‍ය කෘතිය
1) ජෝබ්ගේ පොත   2) එළිදරව්ව පොත   3) දානියල්ගේ පොත   4) ගීතාවලිය

02. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි කතුවරයා
1) පාවුලු තුමාය.   2) ලූක් තුමාය.
3) තියෝපිලස් තුමාය.   4) ජොහාන් තුමාය.

03. ශුද්ධවූ පාවුළුතුමා විසින්ම රචිත සංදේශ ගණන
1) 6 කි.   2) 7 කි.   3) 9 කි.   4) 13 කි.

04. එළිදරව්ව සාහිත්‍යයේ ලක්ෂණයක් නොවන්නේ,
1) ද්විත්ව වාදය   2) යුගාන්ත වාදය
3) සංකේත භාවිතය   4) උපමාවන් යොදා ගැනීම

05. ලෞකික සැප සම්පත් නොව ප්‍රඥාව පමණක් ඉල්ලා යාච්ඤා කළ රජතුමා
1) සාවුල් රජතුමා   2) දාවිත් රජතුමා   3) සලමන් රජතුමා   4) ජෙරබෝවම් රජතුමා

06. ජේසුස් වහන්සේගේ උත්ථානයේ පළමු සාක්ෂිකාරිය වූයේ
1) මග්දලාහි මරියා   2) මරියතුමිය   3) ජාකොබ්ගේ මව   4) සැලෝමි ය

07. නව අහස හා නව පොළව ගැන සඳහන් වන්නේ
1) ගීතාවලියේ ය.   2) එළිදරව්ව පොතේ ය.
3) ජොහාන් සුභාරංචියේ ය.   4) රෝම ලිපියේ ය.

08. අපෝස්තුළුවරු දොළොස් දෙනා අතරින් පළමුව ප්‍රාණපරිත්‍යාග වූයේ,
1) පේදුරු තුමාය   2) ජොහාන් තුමාය.   3) ජාකොබ් තුමාය.   4) ඇන්ඩෘ තුමාය

09. "කතෝලිකත්වය" යන්නෙන් අදහස් කරනුයේ ශු. සභාවේ,
1) විශ්වීය බවයි.   2) සාමකාමී බවයි.   3) ශුද්ධවන්ත බවයි.   4) අපරාජිත බවයි.

10. පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවට පැමිණි පළමු ධර්මදූත නිකාය වනුයේ,
1) ජේසු නිකාය   2) අගුස්තීනු නිකාය
3) ඔරතෝරියානු නිකාය   4) ෆ්‍රැන්සිස්කාන නිකාය

11. දේව ප්‍රසාද නිධානයන්ගේත් ප්‍රසාද නිධානය යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
1) සමඟි සන්ධානය
2) අභිවෘද්ධි ආලේපය
3) පූජාත්වරය
4) දිව්‍ය සත්ප්‍රසාදය

12. ප්‍රථම වරට පූජ හා මිදියුෂ දෙවියන් වහන්සේට ඔප්පු කළේ,
1) දාවිත් රජතුමාය.
2) ආරොන් පූජකතුමාය.
3) මෙල්කිසදෙක් පූජකයාය
4) සකරියස් පූජකයාය.

13. යුදා පාස්කු භෝජනයේ මූලිකාංග හතරට අයත් නොවන්නේ,
1) නුමුහුන් රොටී
2) පාස්කු බැටළුවා
3) මිදියුෂ
4) අගපේ භෝජනය

14. අසරණ සරණ දුතිකාව හා ජීවමනා සාන්තුවරිය යන ගෞරව නාමයන්ගෙන් හඳුන්වනු ලබන්නේ.
1) තෙරේසා මව්තුමිය
2) දේව මාතාවන්ය
3) ශුද්ධවූ ඇග්නස් තුමිය
4) ශුද්ධවූ සිසිලියා තුමිය

15. "මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි." යනුවෙන් උදම් ඇනුවේ,
1) එලිසබෙත් තුමිය
2) මරියතුමිය
3) සකරියස් තුමා
4) සිමියොන් තුමා

16. බලාපොරොත්තුවට විරුද්ධ පාපයකි
1) අවිශ්වාසය
2) අනුමානය
3) ප්‍රේමය
4) හීනමානය

17. පැරණි ගිවිසුම තුළ ප්‍රඥාව සඳහා වන හෙබ්‍රෙව් වචනය වන්නේ
1) අක්කායා
2) හොක්මා
3) නෙයුමා
4) පරුසියා

18. ශුද්ධාත්තම පියතුමන් විසින් 2016 වසර නම්කර ඇත්තේ,
1) ශු. පවුලේ වසර
2) පවුල් හා පැවිදි වසර
3) දයා කරුණාවේ වසර
4) විශ්වාසයේ වසර

19. මවට හා පියාට ගෞරව කිරීම යුතුකමක් බව පෙන්වා දෙන්නේ ............. පනතිනි.
1) හතරවන
2) පස්වන
3) අටවන
4) නවවන

20. ඔබ අතර යමෙක් ප්‍රධානියා වන්න කැමැත්තේ නම් ඔහු ...................... වන්නේය.
1) ඔබේ මිත්‍රයා
2) ඔබේ සොහොයුරා
3) ඔබේ දාසයා
4) ඔබේ ස්වාමියා

21. "ඔබගේ කඩුව කොපුවේ දමන්න කඩු ගන්නා සියල්ලෝම කඩුවෙන් ම නසිති." මෙම ප්‍රකාශය හා සම්බන්ධ සිද්ධිය වනුයේ,
1) ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤා කරමින් සිටි අවස්ථාව
2) ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසූ අවස්ථාව
3) ජේසුස් වහන්සේ අත් අඩංගුවට ගත් අවස්ථාව
4) ජේසුස් වහන්සේ එම්මාවුස් නගරයට වැඩිය අවස්ථාව

22. පස්වන පණත හා අදාළ වන නිවැරදි පිළිතුර වනුයේ,
1) දෙමාපියන් මහළු වූ කල රැකබලා ගැනීම හා උපකාර කිරීම
2) අන් අයගේ දේපළ ද තමන්ගේ ලෙස සලකා ආරක්ෂා කිරීම
3) පාසල තුළ ගුරුවරුනට කීකරු වෙමින් හොඳින් ඉගෙන ගැනීම.
4) මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්වැටි පිටුදකිමින් අන් අයව ද ඉන් බේරා ගැනීම.

23. "මා නුඹ කුසයෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනාගතිමි. නුඹේ උපතට පෙර මම නුඹ කැප කළෙමි." යනුවෙන් කැඳවීම ලද දිවැසිවරයා

1) යෙසායා 2) ආමොස් 3) ජෙරමියා 4) එසකියෙල්

24. ...................... තමාටත්, අසල්වැසියාටත්, දෙවියන් වහන්සේටත් විරුද්ධව කරන පාපයකි. හිස්තැනට වඩා යෝග්‍ය පිළිතුර වනුයේ,

1) කාමමිථ්‍යාචාරයේ යෙදීම. 2) සියදිවි නසා ගැනීම.
3) අන් අයගේ නාමයට අගෞරව කිරීම. 4) අන් අය සතු අවස්තුව සොරා ගැනීම.

25. "මරණයට පත් වුනත් මම මගේ දේව ජීවිතය නැති කර ගන්නේ නෑ" යනුවෙන් ජේසුස් වහන්සේට දුන් පොරොන්දුව ඉටුකළේ,

1) ශුධවූ මරියා ගොරෙත්ති තුමිය 2) ශුධවූ මර්ගරීතා මරිය තුමිය
3) ශුධවූ තෙරේසා මව්තුමිය 4) ශුධවූ සිසිලියා තුමිය

26. විවාහකයන්ට තම පතිව්‍රත හා පතිනිව්‍රත රැකීමට නියම වන්නේ,

1) හතරවන හා පස්වන පණතිනි. 2) හයවන හා දහවන පණතිනි.
3) හත්වන හා දහවන පණතිනි. 4) හයවන හා නවවන පණතිනි.

27. පංච පුස්තකය රචනා කිරීමේදී දායක වූ සම්ප්‍රදායක් නොවන්නේ,

1) වාචික සම්ප්‍රදාය 2) යාවේ සම්ප්‍රදාය
3) එලොහිම් සම්ප්‍රදාය 4) පූජක සම්ප්‍රදාය

28. ඉතා ගැඹුරු දේවධාර්මික සංකල්පයකින් යුත් මෙම ශුභාරංචියට අධ්‍යාත්මික ශුභාරංචිය ලෙසින් නම් කෙරේ. මෙහි ලේඛකයා ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරයෙකි. ක්‍රි.ව. 90-100 කාලයේ එපීසියේ ලියවී ඇත. මීට අදාළ ශුභාරංචිය වනුයේ,

1) මාර්ක් ශුභාරංචිය 2) මතෙව් ශුභාරංචිය
3) ලූක් ශුභාරංචිය 4) ජොහාන් ශුභාරංචිය

29. මැවීම පිළිබඳ දෙවන කථාවට අදාළ වරණය වනුයේ

1) දෙවියන් වහන්සේ හා මිනිසා අතර විශේෂ සබැඳියාවයි
2) ජනවන්දනාත්මක රාමුවක් තුළ මැවීම ඉදිරිපත් කරයි.
3) මැවීමට ගත වූ කාල සීමාව දින හතක් බව දක්වයි
4) දෙවියන් වහන්සේ සිය ස්වරූපයට හා සමානකමට මිනිසා මවයි

30. "මම නොදනිමි. මම මාගේ සහෝදරයාගේ භාරකරුද?" යනුවෙන් දෙවියන් වහන්සේට පිළිතුරු දුන්නේ,

1) ඒසව් ය. 2) කායින් ය. 3) ආබෙල් ය. 4) ආබ්‍රහම් ය.

31. "ක්‍රියා විරහිත ඇදහිල්ල මළ ඇදහිල්ලකි" යනුවෙන් ප්‍රකාශ කරමින් වචනයට පමණක් සීමා නොවී ක්‍රියාකාරී විශ්වාසයකට ඇරයුම් කරන්නේ,

1) ශු. පාවුළුතුමා 2) ශු. ජොහාන් තුමා
3) ශු. ජාකොබ් තුමා 4) ජේසුස් වහන්සේ

32. දෙවියන් වහන්සේ හා නෝවා සමඟ ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වනුයේ

1) ගිනිටැඹ 2) චර්මඡේදනය 3) දේදුන්න 4) වළාකුළ

33. ඉශ්‍රායෙල් ජනතාව ................. මගින් දේව ජනතාවක් වූවා සේම අපිද ................ මගින් දේව දරුවන් වූයෙමු.

1) සීනයි ගිවිසුම - ප්‍රසාද ස්නාපනය
2) දස පණත - කල්වාරි යාගය
3) ව්‍යවස්ථාවලිය - නව පණත
4) සීනයි ගිවිසුම - ප්‍රේමයේ පණත

34. අපගේ ප්‍රසාද ස්නාපනීය පොරොන්දු අලුත් කරන අවස්ථාවකි.

1) දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමේදී
2) අභිවෘද්ධි ආලේපය ලැබීමේදී
3) පාස්කු ඉරුදින දිව්‍ය පූජාවේදී
4) මහා බ්‍රහස්පතින්දා දේව මෙහෙයේදී

35. "ඔහු ස්වාමින් වහන්සේ අබිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේය. ඔහු මිදියුෂවත් මත්පැන්වත් නොබොන්නේය. මව්කුස සිටියදීම ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්නේය." යනුවෙන් දේව දූතයා ප්‍රකාශ කළේ,

1) ජේසුස් වහන්සේ පිළිබඳවය.
2) ස්නාවක ජොහාන් පිළිබඳවය.
3) සකරියස් තුමා පිලිබඳවය.
4) ජෙරමියා දිවැසිවරයා පිළිබඳවය.

36. "එම්බා පොළොං වංශය, එන්න තිබෙන උදහසින් පලා යන්න නුඹලාට අවවාද කෙළේ කවරෙක්ද?" යනුවෙන් ස්නාවක ජොහාන් තුමා දොස් නැගුවේ,

1) සාමාන්‍ය ජනතාවට
2) අයකැමියන්ට
3) සෙබළුන්ට
4) ප්‍රභූ ජනතාවට

37. ජනවන්දනා වසර තුළ මනස්ථාපනයේ කාලයක් ලෙස නම්කර ඇත්තේ,

1) පාස්කු සමය
2) ආගමන සමය
3) උත්ථාන සමය
4) සාමාන්‍ය සමය

38. "දියණිය ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේය" යනුවෙන් ජේසුස් වහන්සේ පැවසුවේ,

1) ජයිසරස්ගේ දියණියට
2) ලාසරස්ගේ සොයුරිය වූ මරියාට
3) නායිම් නුවර වැන්දඹුවට
4) තම සළුවට අත ගැසූ ස්ත්‍රියට

39. "යමෙක් වතුරෙන් ද, ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය." යනුවෙන් ප්‍රසාද ස්නාපනයේ අවශ්‍යතාව ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,

1) උපස්ථායකයින්ට
2) තම ජනතාවට
3) නිකදේමුස්ට
4) අපෝස්තුළුවරුන්ට

40. "යුක්තියට සා පිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝය. ඔවුහු ........................"

1) දෙවියන් වහන්සේ දකින්නෝය.
2) දේශය උරුමකර ගන්නෝය.
3) සැනසීම ලබන්නෝය.
4) තෘප්තිමත් වන්නෝය.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) 1. පාවුලුතුමා සමඟ පළමුවන ධර්මදූත චාරිකාවට සහභාගී වූ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න.
2. ලන්දේසි සමයේ සේවය කළ ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුන් දෙදෙනෙකු නම් කරන්න.
3 ඉශ්‍රායෙලයේ පූජා බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
4. ජුසේවාස් පියතුමාව ශුද්ධවරයට එසවූ ශුද්ධෝත්තම පියතුමා හා දිනය ලියන්න.
5 "ජීවමාන සාන්තුවරිය" නමින් ගෞරවයෙන් පිදුම් ලබන්නේ කවුරුන්ද?
6. බලාපොරොත්තුවට විරුද්ධ පාප දෙක නම් කරන්න.
7. පුරාණ ගිවිසුමේ හෙබ්‍රෙව් පිටපත හා ග්‍රීක පිටපත හඳුන්වන නම් ලියන්න.
8. ඉශ්‍රායෙල් දිවැසිවරුන් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක දක්වන්න.
9. ඉශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්දනය කිරීමට පාරාවෝ රජතුමා ගත් පියවර දෙකක් දක්වන්න.
10. සුවදානයේ ප්‍රසාද නිධාන නම් කරන්න.

02) 1. ප්‍රණාව යනු කුමක්ද?
2. හෙබ්‍රෙව් ප්‍රඥාව ප්‍රභේද තුනක් නම් කරන්න.
3. ඔබේ ජීවිතයේ ප්‍රඥාවන්තව කටයුතු කළ අවස්ථා පහක් ලියන්න.

03) 1. අපෝස්තුළුවරුන් අතරින් ප්‍රාණපරිත්‍යාගී වූ පළමුවෙනි හා අන්තිම අපෝස්තුළුවරයා නම් කරන්න.
2. උපස්ථායකයින් පත්කර ගැනීමේදී සලකා බැලූ විශේෂ ගුණාංග තුන ලියන්න.
3. ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ ඔබගේ සේවාවන් පහක් ලියන්න.

04) 1. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
2. ශු. සතියේ ප්‍රධාන ජනවන්දනා දිනයන් තුනක් නම් කරන්න.
3. චතාරික සමයේ ඔබට කළ හැකි භක්ති අභ්‍යාස පහක් දක්වන්න.

05) 1. ජේසුස් වහන්සේ මුහුණ පෑ පළමු හා දෙවන පරීක්ෂාවලදී දුන් පිළිතුරු ලියන්න.
2. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්යයන් වර්ග තුනක් දක්වන්න.
3. කිතුනු ඔබ ද අන් අය වෙනුවන් දයානුකම්පාව දක්විය හැකි අවස්ථා පහක් ලියන්න.

06) 1. මැවීම පිළිබඳ කථා දෙක අයත් සම්ප්‍රදායන් නම් කරන්න.
2. දේව සමානකම දරණ මිනිසා සතු උතුම්කමේ ලක්ෂණ තුනක් ලියන්න.
3. මිනිසාට මැවිල්ල කෙරෙහි යුතුකම් පහක් ලියන්න.

07) 1.ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
2. නිල පූජකවරයේ ධූර (අවස්ථා) තුන ලියන්න.
3 මීසම තුළ පියතුමාගේ කාර්යයන් පහක් දක්වන්න.

08) කැමති මාතෘකා දෙකක් තෝරාගෙන පේළි 10 බැගින් විස්තර කරන්න.
1. පුරාණ ගිවිසුමේ යාග පූජා
2. පාවුලු සංදේශ
3. ජනවන්දනා වසර
4. ආරම්භක ප්‍රසාද නිධාන
5. කිතුණු පවුල් දිවිය